## 3 වන පිටුවේ

හමුදාවේ අතිශය වැදගත් ප්‍රහාරක ඒකකය මුළුමනින්ම පාවා දුන්නා. එහි බුද්ධි හා ප්‍රහාරක නිලධාරීන් ප්‍රහාකරන්ගේ පිස්තෝල කල්ලියේ ඉලක්ක බවට පත් වී මරු දක්කා. නිවික හමුදාවේ ආරක්ෂක යාත්‍රා මුහුදු කොට්න් විනාශ කර දම්මා. හමුදා හා පොලිස් නීතිය අතුරටම රැකගෙන රාජකාරි කළ උසස් නිලධාරීන් දාම ලැල්ලේ මුත්තන් වගේ එහාට මෙහාට මාරු කළා. උතුරු නැගෙනහිරට ප්‍රවාහනය තහනම් කර තිබූ සෑම ද්‍රව්‍යයක්ම අවශ්‍ය තරම් ගෙන යන්න අවසර දුන්නා.

ඔන්න ඔය විදිහට තමයි වික්‍රමසිංහ මහතා වර්ෂ 2000 සිට 2004 දක්වා ඒජාපයේ වෙනස් නොවන ප්‍රතිපත්ති රැක්කේ. හැබැයි අපි අමතක කරන්න නරකයි 1994 සිය 2000 දක්වා වන්දිකා ජනාධිපතිතුමිය ගේ පාලන කාලයේදී කොට්න් ගහපු ගැහිල්ලත්. කොළඹ තිබෙන තෙල් ටැංකි විනාශ කළා. කටුනායක ගුවන් තොටුපොළට පහර දී එයා ලංකා යානා ගිනිබත් කළා. කොළඹ ප්‍රධාන නගර වල දුම්රිය, බස්රිය ආදීයේ මරාගෙන මැරෙන බෝම්බ කරුවන් බෝම්බ පිපිරුවා. ජනාධිපතිතුමියවත් ඝාතනය කරන්නට මරාගෙන මැරෙන බෝම්බ කාරියක් කඩා පැන්නා. ඒ නව නගර සභා පිටියේ පැළැති මැතිවරණ රැස්වීමක් අවසානයේදී. මෙම සිද්ධීන් වලින් දරුන් ගණනක් මිය ගියා. මේ වන විට ලක්ෂ්මන් කදිගාමර් හිටපු විදෙශ ඇමැති තුමාවත් දන්දිකා මැතිණියගෙ පාලනය යටතේ කොට්න් බිලි ගත්තා.

ඉතින් මේක ජංජාලයක් නොවෙය-?ද.? මහින්ද රාජපක්ෂට අභීයෝගයක් නොවෙද? සාමයත් මගෙ.. ජනතාවත් මගෙ.. ඉතින් කොහොමද මේ ප්‍රශ්නය විසඳන්නේ..? කොටියා ඉල්ලන දේ නොදුන්නොත් යුද්දෙට යන්න වෙනවා. කොටියා ඉල්ලන දේ දුන්නොත් ජනතා යුද්දෙට මැදි වෙනවා. සාමය වෙනුවෙන් රනිල් වික්‍රමසිංහ පමණක් නොව ජේ ආර්, ප්‍රේමදාස, ලලිත්, ගාමිණී වැනි නායකයිනුත් කාපු මඩ කන්න දක්කාම රාජපක්ෂ මහතාගේ යාත්‍රා මුහුදු කොට පපුව පත්තු වෙනවා ඇති. රජිව් ගාන්ධිට ලංකාවේදී පිට කොන්ද හරහා වැළඳ රයිෆල් පහර එතුමාට සිහිනෙනුත් පෙනෙනවා ඇති. ප්‍රේමදාස, ලලිත්, ගාමිණී, රත්නත් විජේරත්න, රජිව්, වෙන්සිල් කොබ්බෑකඩුව ඇතුළු තවත් සිය ගණනක් ප්‍රභූන්ට ජීවිතයෙන් අකාලයේ සමුගන්නට සිදුවුණෙත් සාමය වෙනුවෙන් නේද කියා රාජපක්ෂ මහතාට සිහිපත් වීම පුදුමයක් නොවේ. කළුදලේ ජනාධිපති අපේක්ෂකත්වය ලැබූ මහින්ද සාමය වෙනුවෙන් කලාපනාකාරීව සහ ඉවසීමෙන් ගනු ලබන තීන්දු තීරණ ඔහුගේ අනාගත දේශපාලන ඉරණම සාක්ෂාත් කෙරෙන සාධක බවට පත්වන්නේ මේ හේතු ප්‍රධාන කැරගෙනයි.

හැබැයි මහින්දට "නාවිවී" පනින්නත් බැහැ. මොකද ප්‍රධාන මුළු වල ජවිපෙ කඳවුරු බැඳගෙන ඉන්න නිසා. ජනතා විමුක්ති පෙරමුණට අද ඕනෑ අවුරුදු 27 ක් තිස්සේ පල් ගඳ ගහන සමාජ ආර්තික, දේශපාලන වැඩ පිළිවෙල උඩු යටිකුරු කරන්න. ඒ කියන්නේ මුළු සමාජ දේශයටම සංවර්ධනාත්මක වැඩ පිළිවෙලක් තුළින් ප්‍රතිකාර ලබා දෙන්න. ජනතා විමුක්ති පෙරමුණ මේ සඳහා කෝරගත් වෛද්‍යවරයා වූයේ මහින්ද රාජපක්ෂයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගැන කළකිරීමට පත් වී සිටින ජනතාව රනිල්ට කතිරය ගසා ඔහු ජනපති පුටුවට පත්වුවහොත් තමන්ට අත්වන්නේ කෙබඳු ඉරණමක් දැයි චන්ද්‍රිකා මැතිණිය නොදන්නවා නොවේ. ඒ නිසා අකමැත්තෙන් හෝ තමන් අසතුටු තුරඟයා පිට නගින්නට අවසානයේදී දන්දිකා තීරණය කළා. එහෙත් සුලු පක්ෂ වල සහයයි ප්‍රභාකරන්ගේ සපෝට් එකයි රනිල්ට ලැබෙන විට ශ්‍රීලංනිප තුරඟයාට ජනාධිපතිවරණ දිනුම් කණුවට ළඟාවීම පහසු කාර්යයක් නොවන බව ජවිපෙ දන්නවා. රටේ විශාල තරුණ ජන්ද සංඛ්‍යාවක් හිමි ජවිපෙ මහින්ද රාජපක්ෂ ට සපෝට් කරන්න ඉදිරියට ආවේ ඒ නිසා. ඔහු හරහා අවුරුදු 27 ක සාපයක් නිමා කරවනු අභිප්‍රාය ඇතිව.

හැබැයි ජවිපෙයේ ප්‍රධාන ඉල්ලීම මහින්ද රාජපක්ෂට අනාගතයේ දී මොන විදිහේ ඉරණමක් අත්කැර දේවිද යි දැන්ම ජෙන කියන්න අමාරුයි. ප්‍රධාන වශයෙන් ජාතික ප්‍රශ්න වලදීත්, සුනාමි සහන මණ්ඩලය ගැනත් පැහැදිළි ප්‍රතිපත්ති වලට ජවිපෙන් මහින්දත් එළැඹිලා දුන් ගිවිසුම්ද අත්සන් කොට අවසන්. ජවිපෙ ඉදිරිපත් කළ ජාතික ප්‍රශ්න යනු ප්‍රධාන වශයෙන් එල්ටීටීඊ ප්‍රශ්නයයි. එජාපයත් පොදු පෙරමුණු රජයත් මෙම ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් මෙතෙක් දුරට කළ ක්‍රියා කටයුතු ජවිපෙට අරාධ්‍ය. ඒ නිසා ඊට හාත්පසින්ම වෙනස් මගකට මහින්ද කැටුව යාම ජවිපේ අරමුණයි. ඒ අරමුණ ජනතාවට දුන් පොරොන්දුවක් වශයෙන් පිළිගැනෙන ආකාරයට ජවිපෙ මෙම ගිවිසුම අත්සන් කළේ මහින්ද රාජපක්ෂ ජනපති අපේක්ෂකයා සමගයි. ඒ මිස ඔහු නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග නොවේ.

අනිත් පැත්තෙන් බලන කොට එල්ටීටීඊ ප්‍රශ්නය යනු අද ජාතික ප්‍රශ්නයක් පමණක් නොවේ. ජාත්‍යන්තර බලපෑම්, මැදිහත් වීම්, නිරීක්ෂණ, සාක්ෂිය, සම්මන්ත්‍රණ, සමුළු වැනි විදෙස් නියෝජන බහුල අවධානයක් හිමිකැරගත් ජාත්‍යන්තර ප්‍රශ්නයකි. අවුරුදු ගණනාවක් තිස්සේ යුද ගැටුම්, මැසිවිලි, කෙනෙහිළි, මැදේදේ මෙම ප්‍රශ්නය පැමිණි මගක් ඇත. ඒ සියල්ල හිටි හැටියේ හිටු කියා නවතා ජවිපේ කියන ලෙස වෙනත් පිළිවෙතක්, වෙනත් ගමනක් ආරම්භ කරන්නට මහින්ද රාජපක්ෂට හැකි දයි කියන්නට අපි නොදනිමු. මන්ද එය කියන තරම් ඉටු කරන්නට පහසු කාර්යයක් නොවන බැවින් ය.

අප මුළින් කීවා සේ මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ පරපුර තිබෙන්නේ නොකිළිටි දේශපාලන අතීතයකි. ඒ දේශපාලන අතීතය කීරිහි කඳම්බයකින් බැබලවීමට මහින්ද රාජපක්ෂ ට ජනපති අපේක්ෂකත්වය ලබන තුරු හැකි විය. ඉන් අනතුරුව එළඹෙන්නේ ජනපති පදවියට පත් වුවහොත් එතුමා අභිමුඛ තිබෙන ඉහත සඳහන් ප්‍රධාන ප්‍රශ්නයට මුහුණ දෙන ආකාරයයි. එම ප්‍රධාන ප්‍රශ්නය ඉතා සරළව මෙසේ බෙදා වෙන් කළ හැකි ය.

1 එල්ටීටීයට ආයුධ බිම තබා දේශපාලනයට පිවිසෙන ලෙසට බල කළ හැකි ද?

2 එසේ නොකළහොත් ත්‍රස්තවාදී සංවිධානයක් වශයෙන් සළකන එල්ටීටීඊ යට උතුරු නැගෙනහිර පාලන බලය දීමට සූදානම්ද?

## 2 වන පිටුවේ

ඉවත් වෙනවා. මේ තත්වයට කළ හැකි එක් පිළියමක් වන්නේ අපේ අපනයන භාණ්ඩ වලට ඔස්ට්‍රේලියාවෙන් බදු සහන ලබා ගැනීමයි. මේ පිළිබඳව මා අදාල අංශ සමග සාකච්ඡා කොට යම් යම් අපනයන භාණ්ඩ වලට බදු සහන ලබා ගන්නට කටයුතු කළා. එහි ප්‍රතිඵලයක් ලෙස දැනටමත් ශ්‍රී ලංකාවේ තේ සඳහා බදු ඕලෙවිකින් තොරව තේ රටට තේ ගෙන්වීමට දැන් ව්‍යාපාරිකයනට අවස්ථාව උදා වී තිබෙනවා. එමෙන්ම ශ්‍රී ලංකා තේ මෙරට ප්‍රචලිත කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මන්ඩලයත් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත් සමඟ එක් වී වැඩ පිළිවෙලක් සකස් කරමින් තිබෙනවා.

මේ සඳහා ව්‍යාපාරිකයන්ගේ අවධානය යොමු කරවීමට සිඩ්නි හා මෙල්බර්න් නගර වල වෙළඳ භාණ්ඩ ප්‍රදර්ශණයක් පැවැත්වීමටත් කටයුතු කරනවා. මෙයට අමතරව තවත් අපනයන භාණ්ඩ කීපයකටම මේ ආකාරයේම බදු සහනය ලබා ගැනීමට මම වෙහෙසෙනවා. ඒ එක්කම අපේ අපනයනයන් වැඩි කිරීම සඳහා ව්‍යාපාරිකයන් සමඟ සාකච්ඡා ආරම්භ කොට තිබෙනවා.

**අප රටේ ආර්ථික සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දිය හැකි සංචාරක ව්‍යාපාරයට ඔස්ට්‍රේලියාවේ දායකත්වය වැඩි කර ගැනීමට යම් සැළසුම්ක් තිලෙනවදා?**

අපේ රටට බොහෝ යුරෝපීය සංචාරකයන් ඇවිදී එන්නේ එය නිවර්තන කලාපීය දේශගුණයක් සහිත මුහුදෙන් වට වූ පුංචි ද්වීපයිනක් නිසාවෙන්. ඒ වුණත් ඔස්ට්‍රේලියානු සංචාරකයින් තුදෙක් මුහුදු වෙරළ නිසා ම ලංකාවට එතැයි සිතන්න අමාරුයි. ඒ සඳහා ම නම් මාල දිවයින වැනි රටවල් තියෙනවා. එහෙත් අපේ රටේ තියෙන අනෙකුත් ආකර්ෂණීය ස්ථාන වෙනත් රටවල නැති විශේෂිත වූ ඒවා බව අමතක කළ යුතු නැහැ. ශත වර්ෂ ගණනාවකි සිස්සේ අපේ මුතුන් මිත්තන් විසින් අපට දායාද කරන ලද අපේ පෞරාණික සංස්කෘතිය ලොකු සංචාරක ආකර්ෂණයක් වේවි. උදාහරණයක් ලෙස සීගිරිය වැනි වෙසිතාසික වැදගත් කමින් යුත් ස්ථාන සංචාරක ඝේන්ද්‍රස්ථාන බවට පත් කළ හැකි යි. එවැනි සංස්කෘතික වැදගත් කමක් ඇති ස්ථාන මේ රට තුළ ප්‍රචලිත කිරීමට සංචාරක මණ්ඩලය හා සංචාරක අමාත්‍යාංශය සමඟ වැඩ පිළිවෙලක් සකස් කරමින් පවතිනවා. එමගින් ඔස්ට්‍රේලියානු සංචාරකයන්ගේ අවධානය අප රට කෙරෙහි යොමු කරවා ගත හැකි වෙතැයි මම බලාපොරොත්තු වෙනවා.

මීට අමතරව අපේ රටේ දර්ශණීය ස්ථාන නැරඹීම සඳහා ඝේබල් කාර් සවිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ද ඔස්ට්‍රේලියානු ව්‍යාපාරිකයන් සමඟ මම සාකච්ඡා කරගෙන යනවා. මේ ගැන ඔවුනගේ උනන්දුවක් ද තිබෙනවා. මෙයත් සංචාරකයන් ආකර්ෂණය කරගත හැකි වැඩ පිළිවෙලක් වේවි.

**ශ්‍රී ලංකාවේ රැකියා අවස්ථා වර්ධනය කිරීම සඳහා ඔස්ට්‍රේලියාවෙන් ලබා ගත හැකි ප්‍රයෝජන මොනවාදා?**

විරැකියාවෙන් පෙලුණු 40000 ක් පමණ උපාධිධාරීන් ට මෑත කාලයේ රැකියා ලැබුණු බැවින් ලංකාවේ දැනට උණු රැකියා හිඟයක් පවතින්නේ අපොස උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සමතුන් අතරයි. විදේශ රට වල මෙන්ම අප රටේ ද රැකියා ඉල්ලුම් පිළිබඳ සළකා බැලූවිට අතුරු වෛද්‍ය සේවාවන්ට බොහෝ රටවල දැඩි ඉල්ලුමක් පවතින බව මට පෙනී ගියා. දැන් රටේ විද්‍යා අංශයෙන් උසස් පෙළ සමත් දරුවන්ට මේ අංශ වල පුහුණුවක් ලබා ගත හැකි හමී අප රටේ හෝ විදේශ රට වල රැකියා සොයා ගැනීම අසීරු නැහැ. විශේෂයෙන් හෙද වෘත්තිය සඳහා අද විශාල ඉල්ලුමක් තියෙනවා. එහෙත් අපේ රටේ හෙදියන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය තරම් හෙද විදුහල් නැහැ. හෙද සේවයේ වෙනත් රටවල පිළිගත් තත්වයක් ලබා ගැනීමට නම් වසර 3 ක් අධ්‍යාපනය ලබා හෙද කවුන්සිලයේ ලියා-පදිංචිය ලබා ගත යුතුයි. එක් හෙද සිසුවියක් වසර 3 ක් පුහුණු කිරීම සඳහා රුපියල් ලක්ෂ 3 ක් පමණ වැය වෙනවා. මේ සා විශාල වියදමක් දරන්නට රජයට හැකියාවක් නැහැ.

අනික් අතින් විදේශ ආයතන සිය වියදමින් ලංකාව තුළ හෙද විදුහල් ඇති කර මුදලුත් අය කර අධ්‍යාපනය දෙන්න ගියොත් ඒ තරම් මුදලුත් වැය කරන්න අපේ දෙමාපියන්ට හැකියාවක් නැහැ. ඒ නිසා අපේ රටේ හෙදියන් පුහුණු කිරීමට උදව් කරන්නැයි මම ඔස්ට්‍රේලියානු රජයෙන් ඉල්ලා සිටියා. හෙදියන් පුහුණු කිරීමට යන වියදම ඔස්ට්‍රේලියානු රජයෙන් දරන්නේ නම් ඒ සඳහා අවශ්‍ය සියළුම පහසුකම් ලංකාවේ රජයෙන් ලබා දිය හැකියි. එසේම මේ රටට ගැලපෙන ලෙස ඒ පාඨමාලා සකස් කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ඔස්ට්‍රේලියානු පුහුණු කරුවන් ලංකාවට යැවීමට හා ඔවුන්ගේ ගාස්තු ගෙවීමට ලංකා රජයට කටයුතු කරන්න පුලුවන්. පුහුණුව අවසන් කරන හෙදියන් මේ රටට අවශ්‍ය ප්‍රමාණ වලින් රැකියා සඳහා ලබා දෙන්නට අපට හැකියි. එමෙන්ම ඒ අයට වෙනත් රට වල රැකියා සඳහා යොමු වන්නටත් පුලුවන්. මේ යෝජනාව පිළිබඳව ඔස්ට්‍රේලියානු රජය දැනටමත් තම සැළසුම්ක්ල යොමුකොට තිබෙනවා.

දෙවනුව ඔස්ට්‍රේලියාවේ ශ්‍රමිකයන් ගේ ඉල්ලුම පවතින මෝටර් කාර්මික වැනි අංශයන් හි නිපුණතා සහිත ශ්‍රී ලාංකිකයන් වැඩි වැඩියෙන් බිහි කිරීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරියේ පාඨමාලාවන්ට මෙරටට අවශ්‍ය අංග ඇතැලත් කිරීමට මෙරටේ විශේෂඥ දැනුම ලබා ගැනීමටත් අදහස් කොට තිබෙනවා. මේ පිළිබඳව ඔස්ට්‍රේලියානු පාරිලිමේන්තුවේ කතාපාරාශක වරයා සමගත් කතා කරන්නට මට හැකි වුණා. ඒ මහතා මේ රටේ හිටපු වෘත්තීය පුහුණු අමති වරයා වීම රුකුලක් වුණා.

නිපුණතා සහිත ශ්‍රී ලාංකිකයන් වැඩි වැඩියෙන් බිහි කිරීම සඳහා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වැනි තවත් ආයතනයක් මේ රටේ සහයෙන් ලංකාවේ පිහි-ටුවීමට ඇති ඉඩ ප්‍රස්ථා පිළිබඳව ද සොයා බලමින් පවතිනවා.

**ඔබේ මේ සැළසුම් සඟඟත වැඩ පිළිවෙලට මෙරටේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් දායක කර ගන්නේ කෙසේ දා?**

ඔස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් දැනටමත් තනි තනිව මෙන්ම විවිධ සංගම් හරහාත් ශ්‍රී ලංකාවට ශක්ති පමණින් ආධාර කිරීම අගය කළ යුතුයි. එසේම මා ක්‍රියාත්මක කරන්නට අපේක්ෂා කරන කාර්යයන්ට ඔබේ සහයෝගයත් ඉතා වැදගත්.

මේ සඳහා ඔබ දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ වෙබ් අඩවිය වඩා ක්‍රමවත් කරන්නට මම කටයුතු කළා. ඒ සම්බන්ධ පුවත් පත්‍රිකාවක් නිකුත් කරන්නටත් කටයුතු කර තිබෙනවා. මහ කොමසාරිස් කාර්යාලයේ ක්‍රියාත්මක වන පුවත් කවුළු හරහා ඕනෑම කෙනෙකුට තම අදහස් හෝ යෝජනා ඉදිරිපත් කරන්නට පුළුවන්. මහක තබාගන්න. මගේ කාර්යාලයේ දොරවල් සෑම විටම විවෘතයි. ඕනෑම කෙනෙකුට මට කතා කරන්නත් පුළුවන්.

ඒ වගේම ලංකාවේ ආයෝජන කරන්න කැමති ශ්‍රී ලාංකික ව්‍යාපාරික මහත්වරුන්ට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග සාකච්ඡා කොට ඒ සඳහා අවශ්‍ය සියලුම පහසුකම් සපයා දෙන්න මම කටයුතු යොදනවා. ඔවුන්ට පුළුවන් ඒ පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය සමග සාකච්ඡා කරන්න.

**අවසාන වශයෙන් ඔස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයනට ඔබ දෙන පණිවුඩය කුමක්ද?**

මෙහි වෙසෙන ශ්‍රී ලාංකික ජනතාවට මම දෙන්න කැමති පණිවුඩය තමයි, විදේශයක වෙසෙන ශ්‍රී ලාංකිකයන් වශයෙන් මෙරටට මෙන්ම උපන් රටටද සේවයක් කරමින් අපේ සංස්කෘතික ලක්ෂණ රැකගෙන ලාංකීය පදනමක් මත මෙරට තුළ ඉදිරියට යාමට කටයුතු කිරීම අපේ යුතුකමක් වීය යුතුය යන්න.

ජනතා විමුක්ති පෙරමුණ යුද්ධයට නොසතුටු බව අපි දනිමු. එම පෙරමුණ පමණක් නොව රටේ කුදු මහත් ජනතාව ජාති, ආගම් බෙදයක් නැතිව යුද්ධයට අසතුටුය. නමුත් ජනතා විමුක්ති පෙරමුණ එක් පසෙකත් අනෙක් පසින් එල්ටීටීඊ යත් එක්ව දැමූ සාමයේ ගැටයට මහින්ද රාජපක්ෂ ජනපති අපේක්ෂකයාගේ ගෙළ වික්කෙන් ටික තදවෙමින් තිබෙන බව පෙනෙන්නට තිබෙන සතයයයි. ඒ වේදනාව එජාප ජනපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහට නැත්තේ එල්ටීටීඊයේ දකුණේ නියෝජිතයා වශයෙන් විශාල දේශපාලන කාර්යභාරයක් ඔහු අතින් සිදුවන බැවින් ය.

**අනුර හොරේෂස්**